**ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතන**
**(නාරා ආයතනය)**
**<u>තනතුරු පුරප්පාඩු</u>**

ධීවර,ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (නාරා ආයතනය)යනු ශ්‍රී ලංකාවේ ජලජ සම්පත් විෂය හා සම්බන්ධ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදුකරන එකම රාජ්‍ය ආයතනය වේ.

නාරා ආයතනයේ පහත සඳහන් පුරප්පාඩුව පවතින තනතුරු සඳහා පහත ප්‍රකාශිත සුදුසුකම් හා පළපුරුද්ද සපුරා ඇති පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**අධ්‍යක්ෂ (පාලන හා මානව සම්පත්)**(පුරප්පාඩු ගණන - 01)

**අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය/ ව්‍යාපාර පරිපාලනය/ රාජ්‍ය පරිපාලනය/ වාණිජ්‍ය හෝ තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් ලබා තිබීම.

සමඟ

අදාළ ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් (Post Graduate Degree) ලබා තිබීම හෝ තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක"කළමනාකාර මට්ටමේ" තනතුරක අවම වශයෙන් අදාල විෂය ක්ෂේත්‍රයේ වසර දහතුන (13) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අධ්‍යක්ෂ (මූල්‍ය)**( පුරප්පාඩු ගණන - 01)

**අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම්**

පහත සඳහන් 1 හෝ 2 සපුරා තිබීම

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගිණුම්කරණය/ මූල්‍ය කළමනාකරණ/ ව්‍යාපාර පරිපාලනය/ ව්‍යාපාර කළමනාකරණය/ වාණිජ්‍ය හෝ තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් ලබා තිබීම.

සමඟ

අදාළ ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් (PostGraduate Degree) ලබා තිබීම හෝ තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර මට්ටමේ" තනතුරක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයෙහි වසර දහතුන (13) ක පළපුරුද්දක් ලබා තිබීම.

02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය/ වරලත් සාමාජිකත්වය ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර මට්ටමේ" තනතුරක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයෙහි වසර දහතුන (13) ක පළපුරුද්දක් ලබා තිබීම.

**ඉහත සඳහන් තනතුරු ද්විත්ය සඳහා වූ පොදු කරුණු**

**වැටුප් ක්‍රමය:**

HM 1-3 - රු. 152,500– 15 × 4,100 – 214,000

(2027.01.01 දින තෙක් සිදු කෙරෙන බඳවා ගැනීම් හා උසස් කිරීම් සඳහා වැටුප් ගෙවීම් කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2025 හි II උපලේඛනය පරිදි සිදු කරනු ලබයි.)

**වෙනත් දීමනා :-** මෙම සේවා බාණ්ඩයට හිමි,රජය විසින් අනුමත අදාල වෙනත් දීමනා ද ගෙවනු ලැබේ.

**වයස :**අවු 35 ට නොඅඩු සහ හා අවු 55 ට නොවැඩි විය යුතුය.

**පත්වීමේ ස්වභාවය :-** ස්ථිර,සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතය.

**පොදු කරුණු :**

සෑම ඉල්ලුම්කරුවෙක් ම,

i ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii තනතුරට පැවරෙන කාර්යන් මැනවින් ඉටු කිරිම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරිම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii විශ්ෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**අයදුම්කරන පිලිවෙළ**

සියළුම අයදුම්කරුවන් ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සමග ඔබගේ සම්පූර්ණ ජීව දත්ත පත්‍රිකාව, මුලික අධ්‍යාපන හා වෘත්තිය සුදුසුකම් සනාථකරන සහතික වල පිටපත් සහ උප්පැන්න සහතිකයේ පිටපතක් ද සමඟ **2026 ජුලි 16** වන දින හෝ එදිනට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් **අධ්‍යක්ෂ ජනරාල්,ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය, කාක දූපත,මට්ටක්කුලිය, කොළඹ 15** යන ලිපිනයට එවීමට පියවර ගත යුතුය.අයදුම් කරන තනතුර ලියුම් කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි පැහැදිලිව සඳහන් කළ යුතුය.

ව්‍යුහගත සම්මුඛ පරික්ෂණයන්හි දී ලකුණු ලබාදීම පහත පරිදිවේ.

| | | |
|---|---|---|
| අදාල අතිරේක පළපුරුද්ද සඳහා | ලකුණු | 30 |
| අදාළ අතිරේක අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් සඳහා | ලකුණු | 30 |
| අනෙකුත් කාර්යය සාධනයන් හා කුසලතා සඳහා | ලකුණු | 15 |
| සම්මුඛ පරික්ෂණයේදි කාර්ය සාධනය | ලකුණු | 25 |
| මුළු ලකුණු ගණන | | 100 |

රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩල,සංස්ථා හෝ දෙපාර්තමේන්තුවල ඉල්ලුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතු අතර, ආයතන ප්‍රධානීන් මඟින් එවනු නොලබන, ප්‍රමාද වී ලැබෙන, අසම්පූර්ණ හා අපැහැදිලි අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.


**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය**
**කාක දූපත,**
**මට්ටක්කුලිය,කොළඹ - 15**
**011 – 2521000 / 2521006**
(www.nara.ac.lk)